විදුලි පණිවුඩ : "විශ්‍රාම වැටුප්" කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : "PENSIONS" Colombo

දුරකථන / தொலைபேசி / Telephones } 2320316 / 2421786 / 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax } 2342078

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.
மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.
Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

මගේ අංකය / எனது இல. / My No. } PN 4042 E

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2005.02. 15

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 3/2005
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම - 2004**
**2004.01.01 දිනට පසු මිය යන විශ්‍රාමිකයන් සම්බන්ධයෙන්**
**වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් මවිසින් ඔබ ඇමතු විශ්‍රාම වැටුප් අංක 2/2004 හා 2004.08.19 දිනැති ලිපිය මගින් මා දන්වා ඇත්තේ 2004.01.01 දිනට පසු මිය යන විශ්‍රාමිකයින් සම්බන්ධව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ දී 6/2004 චක්‍රලේඛයේ උපදෙස් නො සලකා කටයුතු කරන ලෙස ය. එනම් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණන් බැලිය යුත්තේ 2003.12.31 දිනට පැවති අඩු නො කළ විශ්‍රාම වැටුප පදනම් කර ගෙන බවයි.

1996.12.31 දිනට පෙර විශ්‍රාම ගොස් ඇති විශ්‍රාමිකයින් 2004.01.01 දින හෝ ඊට පසු මිය යන විට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ දී පහත සඳහන් ලෙස ක්‍රියා කළ යුතු ය.

01. 6/2004 චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් විෂමතාවයන් ඉවත් කර ඇත්නම්, සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවමින් පවතින්නේ නම්, එම විශ්‍රාම වැටුප මත (අඩු නො කළ) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණන් බැලිය යුතු ය.
02. විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කොට නොමැති නම්, එම විෂමතාවය ඉවත් කිරීමෙන් පසු අඩු නොකළ විශ්‍රාම වැටුපට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප ගණන් බැලිය යුතු ය.

මෙහිදී විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම නිසා හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමට ඇත්නම් එය විශ්‍රාමිකයාගේ උරුමකරුවන්ට ගෙවීමට කටයුතු කළ යුතු ය.

වැන්දඹු අනත්දරු සම්බන්ධව විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීමේ චක්‍රලේඛය නිකුත් කෙරෙන තෙක් ඉහත සඳහන් උපදෙස් මත ක්‍රියා කළ යුතු බව කාරුණිකව දන්වමි.

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

පිටපත්
සියලුම දිසා ලේකම්වරුන් වෙත – දැන ගැනීම සඳහා